# කඩුවෙල මහා නගර සභාව

## ලංසු සඳහා ආරාධනයයි (IFB)

01. කඩුවෙල මහා නගර සභාව වෙනුවෙන් නාගරාධිපති විසින්, පහත වගුවේ දක්වා ඇති ව්‍යාපෘති ඉටුකිරීම සඳහා යෝග්‍යතා පූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලබන අතර යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන් පහත සඳහන් සුදුසුකම් නිර්ණායකයන්ට අනුකූල විය යුතුය.

| ලංසු අංකය | ව්‍යාපෘතියෙහි නම | දළ ඉංජිනේරු ඇස්තමේන්තු මුදල (VAT රහිත) | CIDA ලියාපදිංචි ශ්‍රේණිය | ලංසු සුරක්ෂණයේ වටිනාකම (ශ්‍රීලං.රු.) | කොන්ත්‍රාත් කාලය | ආපසු නොගෙවන ලංසු ලිපිලේඛන ගාස්තුව (VAT රහිත) | ලංසු සුරක්ෂණය වලංගු කාලය |
|---|---|---|---|---|---|---|---|
| **KMC 05/04/$T_3$/14/01-2026** | **ඉහළ බෝමිරිය කීල්ස් නිවස ප්‍රජාශාලා ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම.** | **රුපියල් මිලියන5.6** | **C7 හෝ ඉහළ** | **75,000/=** | **දින 90** | **5,000/=** | **දින 119** |
| **KMC 05/04/$T_3$/14/02-2026** | **අතුරුගිරිය පොරෙ පොදු සුසාන භූමිය වටා දැල් වැට සැකසීම.** | **රුපියල් මිලියන7.3** | **C7 හෝ ඉහළ** | **75,000/=** | **දින 90** | **5,000/=** | **දින 119** |
| **KMC 05/04/$T_3$/14/03-2026** | **ශාන්තාලෝකගම සංස්කෘතික මධ්‍යස්ථානය අලුත්වැඩියා කිරීම** | **රුපියල් මිලියන6.4** | **C7 හෝ ඉහළ** | **75,000/=** | **දින 90** | **5,000/=** | **දින 119** |

02. ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය මගින් ලංසුකරණය මෙහෙයවන අතර අසාදුලේඛනගත ලංසුකරුවන් ප්‍රතික්ෂේප කරණු ඇත.

03. මේ සඳහා උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු කඩුවෙල මහ නගරසභාවේ නාගරික ඉංජිනේරු (දුරකථන අංක- 0112270528-0776508752 විද්‍යුත් තැපැල:kadumceng@gmail.com) මගින් විමසීම් හා සතියේ දිනවල කාර්යාලීය වේලාව තුළ නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේදී ලංසු ලේඛන පරීක්ෂා කළහැකිය.

04.කඩුවෙල, නව නුවර පාර ලිපිනයේ කඩුවෙල මහනගර සභාවේ නාගරික කොමසාරිස් වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු ඉහත වගුවේ දක්වා ඇති "ආපසු නොගෙවන ගාස්තුව" නාගරික මුදල් දෙපාර්තමේන්තුව වෙත මුදලින් ගෙවීමෙන් අනතුරුව 2026.06.10 දින සිට 2026.06.23 දින දක්වා වැඩ කරන දිනයන්හීදී 09.00 පැය සිට 15.00 පැය දක්වා කාලයේදී අභිලාෂී ලංසුකරුවන්ට නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවෙන් ලංසු ලේඛන ලබාගත හැක.

05. සියළුම ලංසු කඩුවෙල මහා නගර සභාව, නාගරික කොමසාරිස් නමින්ලබාගත් ශ්‍රී ලංකා රුපියල් 75,000/-ක වටිනාකමින් යුත් ලංසු සුරක්ෂණයක් අමුණා එවිය යුතුය. ලංසු සුරක්ෂණය ශ්‍රී ලංකාවේ පිළිගත් බැංකුවකින් හෝ රක්ෂණ සමාගමකින් පමණක් ලබාගත්,ඉල්ලූවිට ගෙවන කොන්දේසි විරහිත ඇපකරයක් විය යුතුය. ලංසු සුරක්ෂණය 2026.10.20 දින දක්වා වලංගු විය යුතුය.

06. 2026.06.17 දින 10.00 පැයේ සිට නාගරික ඉංජිනේරු ප්‍රධානත්වයෙන් ව්‍යාපෘති වලට අදාළ වැඩ භූමි පරික්ෂාකිරීම ආරම්භ වන අතර ඒ සඳහා ලංසු කරුවන්ට හෝ අවසරලත් නියෝජිතයන්ට සහභාගී විය හැකිය.ඉන්පසු පූර්ව ලංසු රැස්වීම නාගරික ඉංජිනේරු නිළ කාමරයේදී පැවැත්වේ.

07.ලංසුකරු විසින් සම්පූර්ණ කරනලද අනුපිටපතකින් යුක්ත මුද්‍රා තබන ලද ලංසු මුල් පිටපත හා අනුපිටපත යනුවෙන් හා ලංසු අංකය, ව්‍යාපෘතියේ නම කවරයේ වම්පස ඉහල කෙළවර පැහැදිලිව සඳහන් කර 2026.06.24 දින 14.00 පැයට හෝ ඊට පෙර කඩුවෙල නව නුවරපාර ලිපිනයේ කඩුවෙල මහනගර සභාවේ නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව නාගරික ඉංජිනේරු නිළකාමරය තුළ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.ලංසු භාරගෙන අවසන් වූ වහාම ලංසු විවෘත කරන අතර ලංසුකරුට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට මේ සඳහා සහභාගී විය හැක.

08. එක් එක් ව්‍යාපෘති සඳහා ලංසු වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.ලංසු පිළිගැනීම, ප්‍රතික්ෂේප කිරීම හා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීමට ඇති අයිතිය කඩුවෙල මහා නගර සභාව සතු වේ.

ජී.එච්.රන්ජන් ජයලාල් පෙරේරා,
නාගරාධිපති,
කඩුවෙල මහා නගර සභාව, කඩුවෙල.
දුරකථන 0112-539832 / 0112571200
2026.06.08